**විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම) - 2018**

---

විවිධ විදේශාධාර ව්‍යාපෘතියේ (පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීම) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රංශයේ නැටික්සිස් (NATIXIS) බැංකුව අතර 2012 නොවැම්බර් 05 දින එළඹි අංක බී 92 0ඒ 1 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය මහාමාර්ග හා නාවික අමාත්‍යාංශය, වර්ථමානයේ මහාමාර්ග මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවට වානේ පාලම් 46 ක් සැපයීම ආරම්භක අවධියේ අරමුණ වූ අතර පසුව ණයෙන් ලැබෙන මුදල් ඉතිරිකර ගනිමින් තවත් පාලම් 04 ක් එකතු කරන ලදී. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 7,564 කට සමාන යුරෝ මිලියන 45.80 ක් වන අතර එම මුදලින් රුපියල් මිලියන 3,642 කට සමාන යුරෝ මිලියන 22.05 ක් සැපයීමට ප්‍රංශයේ නැටික්සික් (NATIXIS) බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුලි මස ආරම්භ කරන ලද අතර 2015 වර්ෂයේ නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් ඉඩම් අත්පත්කර ගැනීම් අවසන් කර නොමැති අතර 2018 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මතය

---

මූල්‍ය ප්‍රකාශන මගින් ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 02. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ලද තොරතුරුවලට අනුව පාලම් 27 ක ප්‍රතිසංස්කරණ කටයුතු රු.මිලියන 3,084.22 ක වියදමින් 2015 වර්ෂයේදී අවසන් කර ඇත. දින 29 සිට දින 455 දක්වා වූ ප්‍රමාදයන් සහිතව රු.මිලියන 3,395.57ක වියදමින් අනෙකුත් පාලම් 23 හි ප්‍රතිසංස්කරණ කටයුතු ද 2017 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර ඇත.

### 2.2. මතභේදයට තුඩුදෙන කරුණු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| පාලම් 13 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සම්බන්ධ වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් රු.මිලියන 68.04 ක ප්‍රමාද ගාස්තු මෙම ව්‍යාපෘතිය මගින් අයකරගෙන ඇති අතර පාලම් 10 ක ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාලව රු.මිලියන 40.78 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත්කරුවන්ගේ කාලය දීර්ස කිරීම සඳහා මුදා හැර ඇත. | කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ දුර්වල පාලනය | පවතින තොරතුරුවලට අනුව පාලම් 50න් පාලම් **17** ක් ප්‍රතිසංස්කරණය කිරීමට ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරුවන්ට අමතර කාලය දීර්ස කිරීමක් ලබාදී තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් 13 දෙනෙකුගෙන් ද්‍රවශීලතා හානි අයකරගෙන ඇත. කෙසේවෙතත් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ඇතිව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ද්‍රවශීලතා හානි රු.මිලියන 40.78 ක් අඩුකර අදාල කොන්ත්‍රාත්කරුවන්ට මුදා හැර ඇත. | ප්‍රමාදවීම් හා කොන්ත්‍රාත්කරුවන්ගේ කාලය දීර්ස කිරීම් ඉල්ලීම් අවම කිරීම සඳහා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ නිසි අධීක්ෂණයක් අවශ්‍ය වේ. |

### 2.3 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටළු

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ලද තොරතුරු අනුව ඉඩම් කැබලි 305 ක් අත්පත්කර ගැනීමට නියමිතව තිබුණි. එම නිසා ඉඩම් කැබලි 62 ක් | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයේ මෙහෙයුම් දීර්ස කිරීමේ හැකියාව. | සියළුම කට්ටි 62 සඳහා 2018 දෙසැම්බර් 31 වන විට 44 (1) වගන්තිය නිකුත්කර ඇත. මෙම | ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ නිසි සම්බන්ධිකරයක් |

අත්පත්කර ගැනීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ දැන්වීම් නිකුත්කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 වන විට එම වන්දි මුදලින් රුපියල් මිලියන 21 ක් ඉඩම් කැබලි 58 ක් සඳහා ගෙවා තිබුණි. කෙසේවෙතත් 2018 දෙසැම්බර් 31 වන විට ඉඩම් කැබලි 03 ක් පමණක් ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ ලියාපදිංචි කර තිබුණි.

කාරණය අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ නිවැරදිව අධීක්ෂණය කරනු ලැබේ.

පවත්වා ගැනීම සහ නිරන්තරයෙන් ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ.